සම්පත්-, එම්.අයි. පී. එස්., පුස්තකාලය,
කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Sustainability*

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ දී පුස්තකාල සහයෝගිතාවයේ අවශ්‍යතාවය

පොදු අරමුණක් ළඟා කර ගැනිමේ අරමුණින් සම්පත් හුවමාරුව සඳහා පුස්තකාල කිහිපයක් එකට එකතු වී ක්‍රියා කිරීම පුස්තකාල සහයෝගීතාවය ලෙස හැදින්විය හැක. වර්තමානය වන විට පුස්තකාල ක්‍ෂෙත්‍රය තුල පවතින විවිධ වු ගැටලුවලට විසඳුමක් ලෙස පොත් ඇණවුම් කිරීම, මිලදී ගැනීම, සුචිකරණය, ගබඩාකිරීම ආදී විවිධ කාර්යයන් සඳහා පුස්තකාල සහයෝගිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම දැක ගත හැක. එලෙසම මේ වන විට පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ දී ද පුස්තකාල සහයෝගීතාවය ක්‍රියාත්මක කරනු ලොව පුරා දැක ගත හැක.

මෙම පර්යේෂණයේ මුලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණය සිදු කිරිමේදී පුස්තකාල සහයෝගිතාවය යන සංකල්පය ඒ සඳහා සුදුසු වේදැයි පරීක්ෂා කිරීමයි.

දැනට ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල 1151ක් පවතින අතර එම පුස්තකාලවලින් 5%කට ආසන්න ප්‍රමාණයක් හෙවත් මහජන පුස්තකාල 60 ක් මෙම පර්යේෂණය සඳහා නියැදිය ලෙස සරල සසම්භාවී නියැදි ක්‍රමය භාවිත කරමින් තෝරා ගන්නා ලදී. කලින් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් අනුසාරයෙන්, දුරකථන මාර්ග භාවිත කරමින් එම සෑම පුස්තකාලයකම පුස්තකාලයාධිපතිගෙන් අදාළ දත්ත ලබා ගන්නා ලද අතර ඒවා අනුසාරයෙන් තොරතුරු ලබා ගත හැකි විය.

මෙම මහජන පුස්තකාල කිසිවක් මේ වන තුරු ස්වයංක්‍රීයකරණය වීමකට ලක් නැති අතර සියල්ලෙහිම පොත් ප්‍රමාණය 1000ත් 5000ත් අතර පරාසයක පවතියි. එලෙසම මෙම පුස්තකාලවල කිසිදු පුස්තකාලාධිපතිවරයෙකුට හෝ වෙනත් සේවකයකුට පුස්තකාල ස්වයංක්‍රීයකරණයට අවශ්‍ය දැනුමක් නොමැති අතර 40%ක පමණ පිරිසක් තොරතුරු තාක්‍ෂණය පිළිබඳ මූලික දැනුමකින් යුක්ත වූහ. එලෙසම මෙම පුස්තකාල සියල්ලෙහිම පරිගණක ජාලයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවකයන් නොමැති විය. එසේ වුවද මෙම සෑම පුස්තකාලයකටම විදුලි බලය තිබෙන අතර අඩුම තරමේ එක් අන්තර්ජාල සේවා සපයන ආයතනයක් හෝ එම ප්‍රදේශ ආවරණය කර තිබෙනු දැක ගත හැකි විය.

මෙම පර්යේෂණයේ දී ලබා ගත් ප්‍රතිඵල අනුව එළඹිය හැකි නිගමන නම්, මෙම සෑම පුස්තකාලයකම ඇති පොත් ප්‍රමාණය සීමිත බැවින් එක් එක් පුස්තකාලය තනි තනිව ස්වයංක්‍රීයකරණය කිරීමට වඩා සාමුහික ස්වයංක්‍රීයකරණ ක්‍රමයකට යාම වඩාත් සුදුසු වේ, ස්වයංක්‍රීයකරණය කිරීමට අදාල තාක්‍ෂණික දැනුම ඇති අය නොමැති නිසා වෙන වෙනම ජාල පද්ධති පවත්වා ගෙන යාම අසීරු වන අතර තොරතුරු තාක්‍ෂණය පිළිබඳ මුලික දැනුමකින් යුක්ත අය සිටින නිසා සියල්ලන්ටම තොරතුරු තාක්‍ෂණය පිළිබඳ දැනුම ලබා දී ස්වයංක්‍රීයකරණයේ දී දත්ත ඇතුල් කිරීම්, වෙනස් කිරීම් ආදියට ඔවුන් යොදාගත හැකිය. මේ අනුව ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ දී පුස්තකාල සහයෝගීතාවය මත පදනම්ව ක්‍රියා කිරීම වඩා සුදුසු බව නිගමනය කළ හැකිය.